**වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාව - 2023**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වලිකාමම් දකුණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ රු.5,019,809ක් වැය කර ඉටුකළ වැඩසටහන් 03ක් සහ මිලදී ගත් භාණ්ඩ ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජ'නල් සටහන් මගින් ස්ථාවර වත්කම් ලෙස දක්වන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙළ කළ යුතුය. |
| (ආ) | දේශීය සංවර්ධන අරමුදල් ප්‍රදාන යටතේ ඉටුකළ රු. 903,912ක ව්‍යාපෘති 04ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරි මූල්‍ය වර්ෂයේ නිවැරදි කරන බව. | -එම- |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ සභාව විසින් වරිපනම් හා බදු අයවිය යුතු දේපළ 27,590කින් දේපළ 10,166ක් සඳහා K ආකෘති පත්‍ර බෙදා හැර නොතිබුණි. | 2024 වර්ෂයේ 4වන කාර්තුවේ K ආකෘති පත්‍ර බෙදා හැරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.163,912,410ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.129,417,066ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තු ගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 15,323,900 | 15,526,018 | 13,900,944 | 28,910,300 | 15,460,000 | 13,682,074 | 17,696,474 | 27,285,226 |
| කුලී | 54,902,600 | 59,906,350 | 60,502,711 | 315,590 | 56,801,600 | 53,317,529 | 53,125,383 | 911,951 |
| බලපත්‍ර ගාස්තු | 3,149,000 | 4,326,860 | 4,326,860 | - | 2,945,000 | 3,307,303 | 3,307,303 | - |
| වෙනත් ආදායම් | 68,562,000 | 127,447,356 | 127,856,650 | 14,308,448 | 45,387,000 | 96,305,940 | 96,305,940 | 14,717,742 |
| එකතුව | **141,937,500** | **207,206,584** | **206,587,165** | **43,534,338** | **120,593,600** | **166,612,846** | **170,435,100** | **42,914,919** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 01ක සිට වර්ෂ 05කට අධික කාලයක් පැරණි හිඟහිටි වරිපනම් බදු රු.26,649,167ක් සහ වර්ෂ 02කට වඩා පැරණි රු. 4,714,423 ක හිඟහිටි බදුකුලී ශේෂ අයකර නොතිබුණි. එමෙන්ම, වර්ෂ 10කට වඩා පැරණි රු.7,951,852ක හිඟහිටි මුද්දර ගාස්තු ශේෂයක් ද පැවැතිණි. | වරිපනම් බදු අය කිරීමට ජංගම සේවාවක් ක්‍රියාත්මක කර ඇති අතර හිඟ බදුකුලී හා මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟහිටි ආදායම් නොපමාව රැස් කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ ඒලාලෙයි උපකාර්යාල බලප්‍රදේශයට අයත් දේපළ 8,401ක වාර්ෂික තක්සේරුව සිදුනොකිරීම නිසා ලැබිය යුතු වරිපනම් ගණනය කර අයකරගත නොහැකිව තිබුණි. | එම දේපළ ප්‍රත්‍යාගණනය කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුවට යවා ඇත. අනුමැතිය ලද පසු වරිපනම් බදු අයකිරීම් සිදුකරනු බව. | දේපළ කඩිනමින් තක්සේරු කර හිඟ බදු අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාවේ කඩකාමර 05ක් සමාලෝචිත වර්ෂයේ ලංසු කැඳවා නිෂ්කාර්යව පැවැතීම හේතුවෙන් වාර්ෂිකව රු.713,820 ක ආදායමක් අහිමි වී තිබුණි. | ලංසු කැඳවීම, නැවත ලංසු කැඳවීම හා ප්‍රසිද්ධ ලංසු කැඳවීම සිදුකළද, කිසිවෙකුත් අයැදුම් කර නොතිබීම හේතුවෙන් මෙම කඩකාමර බදු දී නොමැති බව. | ලංසු අගයන් සංශෝධනය කර හෝ කඩ කාමර බදු දීමට කටයුතු කළ යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ සුසාන භූමි 03ක් පිහිටි ඉඩම් සහ ජල බවුසරය සභාව නමින් පවරා ගැනීමටත් එහි වටිනාකම තක්සේරු කර ස්ථාවර වත්කම්වල දැක්වීමටත් මේ දක්වා ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉඩම් 03හි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | වත්කම්වල අයිතිය පවරාගෙන ගිණුම්වලට ඇතුළත් කළ යුතුය. |
| (ආ) | සභාවට පරිත්‍යාග වශයෙන් ලැබුණු ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ පැවැති ප්ලාස්ටික් ද්‍රව්‍ය කුඩු කිරීමේ යන්ත්‍රය වර්ෂ 05කට අධික කාලයක් අභාවිතව පැවැතුණි. | 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව ප්‍රකාරව කටයුතු කරන බව. | වත්කම් අරමුණුගත කාර්යයන් සඳහා උපයෝජනය කරගත යුතුය. |

# 4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ අයවැය ප්‍රකාරව ඇස්තමේන්තු ගත ආදායම් සහ වියදම් හා තථ්‍ය ආදායම් සහ වියදම් සමග සැසඳීමේදි ආදායම් විෂයන් 03ක සියයට 33 සිට සියයට 103ක් දක්වාත්, වැය විෂයන් 08ක සියයට 28ක සිට සියයට 88ක් දක්වාත් විචලනයන් පැවැතිම හේතුවෙන් අයවැය, ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණි. | 2024 වර්ෂයේ සිට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | අවශ්‍යතා හඳුනාගෙන සැලැකිලිමත් ලෙස අයවැය සකස් කළ යුතුය. |